" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 0112 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 0112 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 0112 - 2093000

SLSI ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2023.01. 11 |

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන,සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කම්ටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.01.10 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2022.12.02<br>රා.ප.චක්‍රලේඛ 03/2019(IV) | ආයතන සංග්‍රහයේ 11 වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය |
| 02 | 2022.12.02<br>රා.ප.චක්‍රලේඛ 35/92(VI) | රජයේ නිලධරයන් පිළිබඳව විනය පරීක්ෂණ ඉක්මන් කරවීම: ආයතන සංග්‍රහය සංශෝධනය කිරීම XLVIII පරිච්ඡේදය |
| 03 | 2022.12.16<br>රා.ප.චක්‍රලේඛ 30/2022 | 2023 වසර- රාජකාරි කටයුතු ඇරඹීම |
| 04 | 2022.12.17<br>රා.ප.චක්‍රලේඛ 29/2022 | ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 30 වැනි වගන්තිය සංශෝධනය කිරීම |
| 05 | 2022.12.17<br>රා.ප.චක්‍රලේඛ 28/2022 | ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීම |
| 06 | 2022.12.30<br>රා.ප.චක්‍රලේඛ 31/2022 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2023 |

කේ.එන්.සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :30/2022

මගේ අංකය : EST-01/MISCL/06/0032(II)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2022.12. 16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2023 වසර - රාජකාරි කටයුතු ඇරඹීම

"සියවසට පියවරක්" යන තේමාව යටතේ 2023-2048 ඉදිරි විසිපස් වසර සඳහා වන ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රවේශයට අනුගත වෙමින් 75 වන නිදහස් දිනය අභිමානයෙන් සැමරීම 2023 වසරට යෙදී තිබීම රාජ්‍ය සේවයේ නියුතු අප සැම වෙත නවමු අපේක්ෂාවන් ඇති කර තිබේ.

02. කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ වුව ද මහජන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යමින් රාජ්‍යය සේවාවන් පවත්වාගෙන යාමට රාජ්‍ය සේවක සේවිකාවන් දැක්වූ කැපවීම ප්‍රශංසනාත්මකව සිහිපත් කරමු. වර්තමාන ආර්ථික අර්බුදය කෙටි කාලයකින් ජය ගැනීම සඳහා අවශ්‍ය ජාතික හා ජාත්‍යන්තර පදනම දැනටමත් රජය විසින් ස්ථාවරව පිහිටුවා ඇත. ඒ අනුව දිළිඳුකම පිටු දැකීම, විරැකියාව අඩු කිරීම සහ දේශීය නිෂ්පාදන වැඩි දියුණු කිරීම, විදේශ විනිමය ඉපයීම ඉහළ දැමීම ආදිය සඳහා රාජ්‍ය සේවයේ ඔබ සැමගේ සක්‍රීය දායකත්වය හා කැපවීම අවශ්‍යම මොහොතයි මේ.

03. ඉතිහාසයේ කිසි දිනෙක අත් නොදුටු ආර්ථික අර්බුදය තුළ ජන ජීවිතය අසීරුම තත්ත්වයට මුහුණ දී ඇති මෙම කාල පරිච්ඡේදයේ ලෝකයේ ආර්ථික අර්බුදයන්ට මුහුණ දුන් රටවල් ඒ අභියෝගයන් ජය ගැනීමට හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ පිළිබඳව අත්දැකීම් අධ්‍යයනය කරමින් රාජ්‍යය සේවයේ අවශ්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමටත්, රජයේ වියදම් අඩු කිරීම රාජ්‍ය අදායම් වැඩි කර ගැනීමටත් ඔබ සැමගේ අවධානය පෙරටත් වඩා යොමු කළ යුතුය. මහජන සේවා සැපයීමේ කාර්යක්ෂමතාව තහවුරු කරනු වස් පුරවැසි ප්‍රඥප්තීන් හඳුන්වා දීම, මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සේවා සැපයීම හඳුන්වා දීම, අගනුවර කේන්ද්‍රීය සේවා සැපයීම් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමට විමධ්‍යගත කිරීම සඳහා ඔබ සැම අවශ්‍ය පියවර ගත යුතුව ඇත.

04. ආහාර සුරක්ෂිතතාව තහවුරු කරනු වස් සියලු දෙනාටම අවශ්‍ය ආහාර රට තුළ නිෂ්පාදනය කිරීම සඳහා හා සැපයීම සඳහා ඊට සම්බන්ධ සියලුම ආයතන, මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සම්බන්ධ කරගනිමින් ග්‍රාමීය පුනර්ජීවන කේන්ද්‍රයේ සිට ජාතික ආහාර සුරක්ෂිත කමිටුව දක්වා සම්බන්ධ සියලුම රාජ්‍යය සේවකයින් සිය රාජකාරි වපසරියෙන් ඔබ්බට යමින් මෙම ජාතික වගකීම ඉටු කිරීමට කැපවෙනු ඇතැයි විශ්වාස කරමි. තවද ඒ සඳහා තරුණ පරපුරේ දායකත්වය ලබා ගැනීම සඳහා ද පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන, විදේශ ආයතන, ග්‍රාමීය ස්වේච්ඡා සංවිධාන, දේශපාලන අධිකාරීන් හා මහජන නියෝජිතයන් මෙන්ම ආගමික සංවිධාන සමඟ ද සාමූහිකව ක්‍රියා කිරීමට සියලුම මට්ටමේ රාජ්‍ය නිලධාරීන් වගබලා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

05. 2023 වසරේ රාජකාරි ඇරඹෙන පළමු දිනය වන ජනවාරි මස 02 වන සඳුදා දින සියලුම රාජ්‍යය සේවකයින්ගේ සහභාගීත්වයෙන් සිය සේවා ස්ථානයන්හි රාජකාරි කටයුතු ආරම්භ කිරීමේ නිල උත්සවය පැවැත්විය යුතුය. එහි ප්‍රධාන නිල උත්සවය එදින පෙ.ව. 9.00 ට ජනාධිපති කාර්යාල පරිශ්‍රයේදී පැවැත්වේ. ඊට සමගාමීව එදින එම වෙලාවටම පහත දැක්වෙන වැඩසටහන් ජාතික,පළාත්, දිස්ත්‍රික්ක හා

ප්‍රාදේශීය මට්ටම් නියෝජනය කරන සියලුම රාජ්‍ය ආයතන හා කාර්යාලවල පැවැත්වීමට ක්‍රියාකළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන වැඩ පිළිවෙල යොදා ගත යුතුවේ.

I. ජාතික ධජය එසවීම හා ජාතික ගීය ගායනා කිරීම.
II. රණවිරුවන් ඇතුලු දේශය වෙනුවෙන් දිවි කැපකළ සියළුම දෙනා සැමරීම සඳහා විනාඩි දෙකක (02) ක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කිරීම
III. සියලුම කාර්යය මණ්ඩල සමාජිකයන් තම තමන්ට පහසු භාෂාවකින් තම ස්ථානවල සිට මේ සමඟ එවා ඇති රාජ්‍ය සේවා ප්‍රතිඥාව/ දිවුරුම හඬ නගා කියවීම.
IV. වත්මන් අභියෝග ජය ගැනීම සඳහා හඳුන්වා දී ඇති රාජ්‍යය ප්‍රතිපත්තීන් හා වැඩ පිළිවල පිළිබඳව හා එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය සේවකයාගේ දායකත්වය පිළිබඳව ඔවුන් අභිප්‍රේරණය කරමින් කෙටි දේශනයක් පැවැත්වීම.

06. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දු.ක. - 011-2662340
ෆැක්ස් - 011-2692158
විද්‍යුත් තැපැල - pubad.estad1@gmail.com

පිටපත් -: ගරු පළාත් ආණ්ඩුකාරවරුන් වෙත

# රාජ්‍ය සේවයේ ප්‍රතිඥාව/ දිවුරුම

දෙදහස් විසි තුන වර්ෂයේ රාජකාරි අරඹන පළමු වැනි දිනය වන අද දින,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ලක් වැසි ජනතා අපේක්ෂාවන්
යථාර්ථයක් බවට පත් කරන නව වසරක සමාරම්භය සනිටුහන් කරයි.

අදින් ඇරඹෙන නව වසරේ
එකම රටක්, එකම දැයක් තුළ, එක කොඩියක සෙවණේ
එක්සත්ව හා එක්සිත්ව විකසිත වන
සුරක්ෂිත වූ අපගේ මාතෘ භූමිය තුළ
''සියවසට පියවරක්'' යන දැක්ම පෙරදැරි කර ගනිමින්
ඉදිරි පස්විසි වසර තුළ කලාපයේ සෞභාග්‍යයමත් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ලෙස
මාගේ  මාතෘ භූමිය පත් කිරීම උදෙසා මානව හිමිකම් සුරකින,
අන්‍යෝන්‍ය ගරුත්වය හා විශ්වාසය සුරකින විනයගරුක, නීතිගරුක හා ගුණගරුක
සමාජයක් බිහිකිරීමටද, තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගනිමින්
ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකරලීමට ද
නූතන තාක්ෂණයෙන් සන්නද්ධ සශ්‍රීක මානව සම්පත මෙහෙයවන
පිරිසිදු රාජ්‍ය පාලනයක කොටස්කරුවෙකු වන මම,
මහජන මුදලින් වැටුප් ලබන රජයේ සේවකයෙකු ලෙස
රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා
මා වෙත පැවරෙන්නා වූ කාර්යභාරය

කාර්යක්ෂමව,
සඵලදායීව,
තිර අදිටනින් යුතුව,
උපරිම කැපවීමෙන්,
අවංකභාවයෙන්,
මහජනතාවට පක්ෂපාතීව,

සපුරා ඉටු කරන බවට ප්‍රතිඥා දෙමි/ දිවිරුම් දෙමි.